02113

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2024/2025
අවසාන පරීක්ෂණය (1 වන අදියර)
**STP 8302/ STP 8502/ ESP 2202 - අධ්‍යාපනයේ මූලධර්ම**
කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.04.27 වේලාව - පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. අධ්‍යාපන දර්ශනය පිළිබඳ දැනුම ගුරුවරයාට ප්‍රයෝජනවත් වීමට හේතු තුනක් (03) නම් කර ඉන් එකක් (01) කෙටියෙන් විස්තර කරන්න.

02. ජෝන් ඩුවි හඳුන්වා දුන් විෂයමාලාව සකස් කිරීමේ දී සැලකිලිමත්විය යුතු කරුණු හතරක් (04) සඳහන් කර ඒවායින් එකක් (01) කෙටියෙන් විස්තර කරන්න.

03. "ආකල්ප" යන සංකල්පය නිර්වචනය කර, ආකල්ප හා සම්බන්ධ කාර්යයන් හතරක් (04) ක් නම් කරන්න.

04. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ ගුණාත්මක අධ්‍යාපනය තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර හතරක් (04) සඳහන් කරන්න.

05. ප්‍රති-සමාජානුයෝජනය (Re-Socialization) යන්න සුදුසු උදාහරණයක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න.

06. පරම්පරා අතර සහ පරම්පරාව තුළ සමාජ සචලතාව අතර වෙනස කෙටියෙන් විස්තර කරන්න.

07. "අවිධිමත් අධ්‍යාපනය" අපට වැදගත්වන ආකාරය සඳහා හේතු පහක් (05) සඳහන් කරන්න.

08. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය මුහුණදෙන ප්‍රධාන ගැටලු පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05x08=40)



15

## 02 - වන කොටස

09. **"අධ්‍යාපනය ස්වාභාවික ක්‍රියාවලියක් බැවින්, අධ්‍යාපන ක්‍රියාවලියට සහායවීම ගුරුවරයාගේ කාර්යයයි." - මාරියා මොන්ටිසෝරි.**

(i.) මොන්ටිසෝරි අධ්‍යාපන දර්ශනය තුළ දැකිය හැකි මූලික ප්‍රතිපත්ති හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii.) මොන්ටිසෝරි අධ්‍යාපනයේ විශේෂ ලක්ෂණ හතරක් **(04)** සඳහන් කර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඉන් එකක වැදගත්කම අගයන්න. (ලකුණු 08)

(iii.) ගුරුවරයා සහ ඉගැන්වීම පිළිබඳ මාරියා මොන්ටිසෝරිගේ අදහස් ශ්‍රී ලාංකික පංතිකාමර සන්දර්භය තුළ කෙතරම් දුරට ක්‍රියාත්මක වී ඇත්දැයි විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

10. **"සාරධර්ම අධ්‍යාපනයේ අරමුණ වන්නේ සාරධර්ම නිර්මාණය කිරීම සහ ඒවායේ වටිනාකම් හැසිරීම්බවට පරිවර්තනය කරන පුද්ගලයින් බිහි කිරීමයි."(Turkkhraman 2014)**

(i.) "ආන්තික සාරධර්ම" සහ "උපකාරික සාරධර්ම" යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) ශ්‍රී ලාංකීය පාසල් සිසුන් තුළ සංවර්ධනය කළ යුතුයැයි ඔබ සිතන සාරධර්ම හතරක් **(04)** නම් කර, ඊට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) සිසුන් තුළ සාර්ධර්ම සංවර්ධනය කිරීමේ දී ගුරුවරුන් මුහුණදෙන අභියෝග මොනවාද? සුදුසු නිදසුන් හතරක් **(04)** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. **"නව යොවුන්වියේ දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියේ දී සමවයස් කණ්ඩායම් තීරණාත්මක බලපෑමක් සිදුකරයි."**

(i.) සමාජානුයෝජන ක්‍රියාවලියේ දී සමවයස් කණ්ඩායම් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) සහයෝගී ඉගෙනුම (Co-operative Learning) මඟින් සමාජ කුසලතා සංවර්ධනය කරගැනීම සඳහා සමවයස් කණ්ඩායම් උදව් වන ආකාරය හේතු හතරක් **(04)** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) සමාජ මාධ්‍ය (Social Media) සිසුන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියට සිදුකරන ධනාත්මක බලපෑම් දෙකක් **(02)** සහ ඍණාත්මක බලපෑම් දෙකක් **(02)** පරීක්ෂා කරන්න. (ලකුණු 08)

12. අධ්‍යාපන ක්‍රියාවලියේ දී ශිෂ්‍යයන් අයත්වන සමාජ පංතිය පිළිබඳව ද ගුරුවරයාගේ අවධානය යොමු වීම අවශ්‍ය වේ.

(i.) "සමාජ පන්තිය" යන සංකල්පය සඳහා ඔබේම නිර්වචනයක් සපයන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලාංකික සමාජයේ දැකිය හැකි සමාජ පංති තුනක් (03) නම් කර ඉන් එකක සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) සමාජ පංතියට අදාලව සිසුන් මුහුණ දෙන අධ්‍යාපන ගැටලු තුනක් (03) නම් කර ඒවායින් එකක් විසඳීමට ගුරුවරයෙක් ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. "අධ්‍යාපනය මනුෂ්‍යයාට අත්‍යාවශ්‍ය ලෙස සලකන අතර විවිධ ක්‍රම ඔස්සේ පුද්ගලයන්ට අධ්‍යාපනය ලබාගත හැකිය."

(i.) නොවිධිමත් අධ්‍යාපනය, විධිමත් අධ්‍යාපනයෙන් වෙනස් කොට සැලකීමට අදාළ කරුණු හතරක් (04) ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(ii.) සංවර්ධනය වෙමින් පවතින රටවල නොවිධිමත් අධ්‍යාපනය සඳහා වන වගකීම් මොනවාද? හේතු හතරක් (04) දෙන්න. (ලකුණු 08)

(iii.) ශ්‍රී ලංකාවේ නොවිධිමත් අධ්‍යාපනය හා සම්බන්ධ ගැටලු හතරක් (04) හඳුනාගෙන එම ගැටලු මඟහරවා ගැනීම සඳහා සුදුසු විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 08)

---

14. "පුද්ගලයෙකුගේ උපතේ සිට මරණය දක්වාම අධ්‍යාපනය ලබාගත හැකි බව අධ්‍යාපනඥයන්ගේ අදහස වී තිබේ."

(i.) ඉගෙනුම් කේන්ද්‍රීය සමාජයක් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)

(ii.) යාව-ජීව අධ්‍යාපනයේ ප්‍රධාන ලක්ෂණ හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) යාව-ජීව අධ්‍යාපනය මඟින් ලබාගත හැකි ප්‍රයෝජන හතරක් (04) නම් කර, ඉන් එකක් පුද්ගලයෙකුගේ ජීවිතයට වැදගත්වන ආකාරය තක්සේරු කරන්න. (ලකුණු 08)

*- සියලුම හිමිකම් ඇවිරිණි. -*



17